**ප්‍රශංසා එකතු සුපවත**
**2017 දෙසැම්බර් මස 04 වෙනි දින සිට දෙසැම්බර් 10 වෙනි දින දක්වා**
**පියාණන් වහන්සේගේ මන්දිරයේ අප නවතින තවත් වැදගත්**
**නැවතුම්පලක් වන්නේ ආළින්දයයි.**

01. ප්‍රශංසාව සඳහා -
   * ගීතා 27:4 **" හිමිතුමන්ගෙන් එකම යැදුමක් යදිමි. එය තරයේ සොයන්නෙමි. එනම් හිමිතුමන්ගේ ශෝභාලංකාරය නරඹන පිණිසත්, දේව මාළිගාවේදී උදය භාවනා කරන පිණිසත්, මා දිවි ඇති තාක් හැමදා සමිඳුන්ගේ මන්දිරයේ විසීමටය."**
   * යාච්ඤාව පියාණන් වහන්සේගේ තුරුලට යන ගමනකි. ශුද්ධාත්මයාණන් වහන්සේ අපව මෙසේ රැගෙන යන සේක. එහෙයින් ශුද්ධාත්මයාණන් වහන්සේට අපව නතුකර ගන්නට ඉඩ දෙමින්, අප හදවත්වල ගැඹුරු පිපාසයක් ඇති කර ගනිමු.
   * පුබුදු ගී 294 "ගෙන යනු මැනවි මා ....."

02 පසුගිය සතිය තුළ අත්දැකීම් බෙදා ගනිමු.
   * මගේ පැය යාච්ඤා ජීවිතය මුල් කරගෙන
   * දෛනික ජීවිතයේ සිදුවීම් මුල් කරගෙන
   * ඒ සැම දෙය වෙනුවෙන් සමිඳාණන් වහන්සේට ස්තූති ප්‍රශංසා කරමු.

03. සතියේ සුපුවත:
   * පුබුදු කැරිස්මාව ඔබගේ / මගේ ජීවිතයේ පදනම විය යුතුයි. පුබුදු කැරිස්මාව තුළ ක්‍රිස්තුන් වහන්සේ දෙස බැලීමට පුබුදු ජනතාවක් ලෙස අපට ඔවුන් වහන්සේගෙන් විශේෂ අනුග්‍රහයක් ලැබී ඇති බැවින්, එම ත්‍යාගය වෙනුවෙන් සමිඳාණන් වහන්සේට මොහොතක් ස්තූති කරමු.
   * මෙහි පහත සඳහන් ශුද්ධ ලියවිලි පාඨය කියවා ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳව කුමක් අනාවරණය කරයිද යන්න කුඩා කණ්ඩායම් තුළ බෙදා ගන්න.
   * දෙසැම්බර් මස 10 වෙනි ඉරුදින සුපුවත - ශු.මාක් 1:1-8
   * දේව පුත්‍ර ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ සුබ අස්නේ ආම්භය මෙයය.... **"මෙන්න මාගේ දූතයා ඔබට පෙරටුව යවමි. හෙතෙම ඔබ වඩනා මඟ පිළියෙල කරන්නේ ය; සමිඳුන්ගේ මඟ පිළියෙල කරන්න. එතුමන් හට ඇද නැති මාවත් සාදන්නැ'යි පාළුකරයෙහි මොරගා කියන හඬක් වේ! එපරිද්දෙන් ස්නාවක ජොහාන් තෙමේ 'පව් කමාව පිණිස මනස්තාප වී බව්තිස්ම ස්නාපනය ලැබිය යුතු ය'යි දේශනා කරමින් පාළුකරයෙහි පහළ විය. ....."**
   (සම්පූර්ණයෙන් කියවන්න.)

04. වචනයේ සේවකයා සඳහා :
   * ආලින්දය යනු පියාණන් වහන්සේගේ මන්දිරයේ අප නවතින තවත් වැදගත් නැවතුම් පලකි. නිශ්චලතාවය රජ කරන තැනකි. මෙතනදී ශුද්ධ ලියවිල්ල මෙන්ම විවිධ පොත පත මඟින් ක්‍රිස්තුන් වහන්සේ දෙස බැලීමට පුළුවන.
   * ශු.මාක් තුමාගේ සුවිශේෂක වාර්තාව අනුව ස්නාවක ජොහාන් තුමා මගින් ශුද්ධාත්මයාණන් වහන්සේ අපට ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳව කුමක් පවසයිද?
   * අපි බලාපොරොත්තු නොවන මොහොතක ක්‍රිස්තුන් වහන්සේ අප වෙත පැමිණෙන සේකැයි අපි නිතර නිතර මෙනෙහි කරන්නෙමු. මේ වචන මරණය ගැන අනතුරු ඇඟවීමකයි සිතන්නට අපි පුරුදු වී සිටිමු. එපමණක් නොව ඊට තවත් අර්ථ කථනයන් දිය හැකිය. එනම්, අප බලාපොරොත්තු නොවන මොහොතක, නොසිතන ආකාරයෙන් ඔවුන් වහන්සේ අප හමුවීමට පැමිණෙනු ඇත. ඊට අවදිවන්න, ඔවුන් වහන්සේව පිළිගන්න. සැම මොහොතකම ක්‍රිස්තුන් වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් අපව ස්නපනය කරන සේක. අපව ආලේප කරන සේක.
   * දෙවියන් වහන්සේගේ පුතෙකු දුවෙකු ලෙස ජීවත් වීමට අපව කැඳවන සේක.
   * එහෙයින් අපි පසුතැවී සිත් හරවා ගනිමින්, ගැඹුරු මනස්ථාපනයකට ඇතුළු විය යුතු වෙමු.
   * ක්‍රිස්තුන් වහන්සේගේ දේව පුතභාවය මනුෂ්‍ය පුත්‍රභාවය මෙලෙස අපගේ මනුෂ්‍ය පුත්‍රභාවයට අභියෝග කරනු ලබයි.

* එසේ නම් දේව පුත්‍රභාවයට ජනිත කරන අපගේ ජීවිත තුළ හැම අවස්ථාක්ම ප්‍රයෝජනයට ගෙන දේව පුත්‍ර ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ සුබඅස්න අනෳයන්ට සාක්ෂි දැරීමට අපව කැඳවනු ලබයි.

05. අවසාන යාච්ඤාව - 'මගේ පැය' ගමන තුළ ආලින්දයේ අත්දැකීම මුල් කරගෙන අනෳයන්ට ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ සාක්ෂි දරමු. අපගේ අත්දැකීම් දිනපතා එකිනෙකා සමග සාංඝික කර ගනිමු.
පුබුදු ගී අංක 221 "ජේසුනී සමිඳේ....."

========================

ප්‍රශංසා එකතු සුපවත
2017 දෙසැම්බර් මස 11 වෙනි දින සිට දෙසැම්බර් 17 වෙනි දින දක්වා
දේව පුත්‍රභාවය සාංඝිකයි

01. ප්‍රශංසාව සඳහා : (යෙසායා 61:10)

* මම සමිඳුන් කෙරෙහි බොහෝ ප්‍රීතිමත් වෙමි. මාගේ දෙවිඳුන් කෙරෙහි මම ප්‍රීතියෙන් පිනා යන්නෙමි. මනාලයෙකු මල් මාලාවක් දමා ගන්නාක් මෙන්ද මනාලිය ඇයගේ ආභරණ පැළඳ ගන්නාක් මෙන්ද එතුමාණෝ ගැලවීම නමැති වස්ත්‍රය මට පළඳවන සේක. ධර්මිෂ්ඨකම නැමති සළුව මට හඳවන සේක.

* මොහොතක් නිශ්චලව සමිඳාණන් වහන්සේගේ ගැලවීමේ පොරොන්දුව කෙරෙහි විශ්වාස කරමු. මේ මොහොතේ ඔබ / මා කුමන තත්ත්වයක සිටියත් ඔවුන් වහන්සේගේ දයාව කරුණාව මෙන්ම අප කෙරෙහි තබා ඇති විශ්වාසවන්තකම නොවෙනස්ව පවතින බැවින් අපගේ සිත් සමිඳාණන් වහන්සේට විවෘත කරමු.

* එතුමාණෝ මේ මොහොතේ මනාලියකගේ ආභරණ මෙන් ගැලවීමේ වස්ත්‍රය මට පළඳවා ධර්මිෂ්කම නමැති සළුව හඳවන සේක.

* සමිඳුන්ට ප්‍රශංසා වේවා! පුබුදු ගී 84 "උදේ හවා..."

02. පසුගිය සතියේ අත්දැකීම සාංඝික කර ගනිමු.
   i පසුගිය සතියේ අපි ආලින්දය ගැන කථා කළෙමු. එහිදී පසුගිය සතිය පුරා ක්‍රිස්තුන් වහන්සේ දෙස අපගේ නෙත් සිත් යොමු කළ විට, ශුද්ධාත්මයාණන් වහන්සේ අපට කුමක් පැවසීද? අපගේ මනුෂ්‍ය පුත්‍රභාවයට අභියෝගයක් වූ අයුරු ... සාංඝික කර ගනිමු.
   ii එසේම දෛනික ජීවිතයේ සිද්ධීන් හරහා දේව ආදරය අත්දුටු අයුරු බෙදා ගනිමු.

03. සතියේ සුපුවත : (අද අපි සාලයේ අත්දැකීම පිළිබඳව මදක් මෙනෙහි කරමු.)

(අ) මගේ පැයේ ගමන තුළ සාලයේ විශේෂිත වූ අත්දැකීමකි. මන්ද අපට සිතා ගන්න හැකි සෑම කෙනෙකුටම සාංඝික වන තැනකි. සාන්තුවරයන්ගේ සමෝස ධර්මලාභය මෙන්ම ඇඟිලි 5 උදව් කරගෙන අපට එකමුතු විය හැකි තැනකි. සෑම කෙනාවම සිතින් හමුවන තැනකි.

(ආ) පහත සඳහන් ශු.වාක්‍ය කියවා සාංඝික වීමට බාධා කරන අපගේ මූලික බාධාව කුමක් දැයි සාකච්ඡා කොට බෙදා ගන්න.
* "යමෙක් මා අනුව එන්න කැමැත්තේද ඔහු තමකම නසා කුරුසිය දරා මා අනුව ඒවා" (ශු.මාක් 8:34)

04. වචනයේ සේවකයා සඳහා :
* තමකම යනු ආත්මාර්ථයයි. ආත්මාර්ථය යනු මමත්වයයි. එනම් මගේ කැමැත්ත, මම හරියි කියා සිතා කටයුතු කිරීම, අපගේ මනුෂ්‍ය බුද්ධියට සරිලන ආකාරයෙන් අපට එකිනෙකාට එකමුතු වීමට, ප්‍රේම කිරීමට, දයා කරුණාව දැක්වීම සමාව දීමට බැරි බව

අත්දකින විට ඒවාට නිදහසට කරුණු කියා පාමින් සමහරවිට සාධාරණීකරණය කරමින් හෝ ද්වේෂ සහගත තත්ත්වයන් වලට පත් වී මානසික අන්ධකාරයට, පාප අන්ධකාරයට හා නපුරාගේ අන්ධකාරයට හසුවීමයි.
* කුරුසිය ප්‍රේමයේ සළකුණයි. ගැඹුරු සාංඝිකත්වය පිළිබිඹු කරයි. ක්‍රිස්තුන් වහන්සේ තුළ කුරුසිය දරා ඔවුන් වහන්සේ අනුව යාම නම් ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමයේ ආඥාව ඉටු කිරීමයි. ඒ තැනැත්තේ ගැළවීම නමැති වස්ත්‍රය පැළඳ ගනී. ධර්මිෂ්ඨකම නමැති සළුව පැළඳ ගනී.
* එහෙයින් සාලයේ අත්දැකීම අපව සාංඝිකවීම තුළින් දේව පුත්‍රභාවයට ඔසවනු ලබයි.
* මනස්ථාපනයේ අත්දැකීම තුළින් දේව පුත්‍රභාවයේ අභිමානය පිළිබඳව අන් අයට සාක්ෂි දරමු.

05. අවසාන යාච්ඤාව :
* මගේ පැය ගමනට අපව පිපාස කරන මෙන් යාච්ඤා කරමු.
පු.ගී. 290 "මා හදවත් දොර අරින්නෙමි...."

================

**ප්‍රශංසා එකතු සුපවත**
**2017 දෙසැම්බර් මස 18 වෙනි දින සිට දෙසැම්බර් 24 වෙනි දින දක්වා**
**පියාණන් වහන්සේගේ තුරුල්ලෙහි අපි රැඳී සිටිමු**

01. ආරම්භක ගීය - පුබුදු ගී අංක 294 "ගෙන යනු මැනවි මා ....."

02. ප්‍රශංසාවට යොමුව :
* සතිපතා මෙසේ අප එක්වන්නේ දෙවියන් වහන්සේ දුබල, පව්කාර අපට දක්වන ඒ අති මහත් ආදරය වෙනුවෙන් ස්තූතියි කියන්න, ඔවුන් වහන්සේගේ මහිමයට ප්‍රශංසා කරන්න, සැබවින්ම අපට දෙවිඳුන් පැසසීම හැරුනු විට මොනයම් දෙයක් පියාණන් වහන්සේට කළ හැකිද? මැවුම්කරුවාණන්ගේ ඒ මැවීමේ කාර්යය තුළ දූවිල්ලෙන් මවා නිම කළ අප ඔවුන් වහන්සේට කුමක් කළ හැකිද? කළ හැකි එකම දෙය ඔවුන් වහන්සේ මහෝත්තමයාණන් යැයි පැසසීම පමණකි.
* සෑම දිව්‍ය යාගයක් තුළදී "දෙවිඳුන් පැසසීම යුතුය, යෝග්‍යය, සාධාරණය, ගැළවීමදායකය" යනුවෙන් ප්‍රකාශ කරනු ලබන්නේ ඒ නිසාමය. දුබල අප සූදානම් වනුයේ ඒ යුතුවූද, යෝග්‍යවූද, සාධාරණවූද, ගැළවීමදායකවූද දෙවිඳුන් පැසසීමේ කාර්යය දැනුවත්වම ඉටු කිරීමටය. එය හුදු වචන ස්වල්පයක් නොවිය යුතුය. ඒ සඳහා අපව මෙහෙයවීමට ශුද්ධාත්මයාණන් වහන්සේට ඉඩ දෙමු. ඔවුන් වහන්සේ දානය කරන වරම් දීමනා අත්දකිමින් ප්‍රශංසාවට ඇතුළු වෙමු.
* පුබුදු ගී අංක 103 "තුති ප්‍රශංසා වේ ....."

03. සුපුවත :
* යාච්ඤාව යනු දෙවියන් වහන්සේට මට ප්‍රේම කිරීමට ඉඩදීම යයි අපි දනිමු. යාච්ඤාවේ ගමන තුළ පසු කළයුතු පියවරවල් කිහිපයකි. එනම් දිව්‍යමය කියවීම, ද්විත්ව අවදිවීම, එලිපත්ත, ආලින්දය හා සාලය යන විශේෂිත ස්ථාන පසු කරමින් ශුද්ධාත්මයාණන් වහන්සේ අප රැගෙන යනු ලබන අයුරු භාවනා කළෙමු. අප පසුකල නැවතුම් ස්ථාන තුළදී ලද නිදහස් භාවය සමගින් සියල්ලෙන් හිස්වූ ඇතුලාන්තයකින් සමිඳු තුරුල්ලට යාමට අපට කැඳවීමකි.
* ඒ කැඳවීම දානය කරනුයේද ශුද්ධාත්මයාණන් වහන්සේමය. පියාණන් වහන්සේගේ තුරුල්ලට යෑම අපගේ ශක්තියෙන් කළ නොහැකි බව දකින ශුද්ධාත්මයාණෝ ඒ ගමනේදී කළ යුතුව ඇත්තේ අපට නොතේරෙන, අපට නොදැනෙන එහෙත් දැනුවත්වම සිදුවන අති උතුම් මොහොතට අප කැඳවා ගෙන යාමට ඔවුන් වහන්සේට ඉඩහැරීම පමණි.
* සාලයේදී අප අත්දුටු නොනවතින මහා ප්‍රශංසාවක යෙදෙන ශුද්ධවන්තයින් හා සුරදූත හමුදාවේ මහා වන්දනා නමස්කාරය ලබන මහෝත්තම දෙවියන් වහන්සේට වෙනත් කිසිදු සිතුවිල්ලකින් හෝ හැඟීමකින් තොරව ඔවුන් වහන්සේ වෙතම රැඳෙමු. ඒ මහා තේජශ්‍රීය, දකිමු. ඔවුන් වහන්සේට මට ප්‍රේම කිරීමට ඉඩ හරිමු.

* මහා ප්‍රශංසාවේ ඝෝෂාව නැගුනද එතැන මමත් මහෝත්තම සර්ව පරාක්‍රම දෙවි පියාණන් වහන්සේ පමණි. කිසිදු කථාවක්, වචනයක්, සිතුවිල්ලක් එහි නොමැති වුවද මම ඔවුන් වහන්සේගේ තුරුල්ලේ රැඳී සිටිමි. හඬක්, ශබ්දයක් නොනැගුනද මම එහිය. කිසිවක් නොපෙනුනද, නොදැනුනද මම එහිය. ඔවුන් වහන්සේ තුරුල්ලේ රැඳී සිටිමි. රැඳී සිටිමි. රැඳී සිටිමි.

04. සතිය පුරා :

* ඇතැම් විට මගේ පැයේදී නිවහනට ඇතුළු වීම අසීරු විය හැක. එහෙත් එය අත්හැර නොදමන්න. එයට ආශාවක් ඇතිකර ගනිමින් ඇතුළු වීමට ශ්‍රද්ධාත්ම වරම් පතා යාච්ඤා කරන්න.
* නියම කරගත් වෙලාවකදී වෙන්කර ගත් ස්ථානයක මගේ පැයට ඇතුළු වන්න. හැකි හැම විට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ හමුවේ පෙනී සිටින්න.

05. අවසන් ප්‍රශංසාව:

පුබුදු ගී අංක 417 "ඔබ තුරුල්ලෙහි රැඳෙමි මම්....."

*****************

**ප්‍රශංසා එකතු සුපවත**
**2017 දෙසැම්බර් මස 25 වෙනි දින සිට දෙසැම්බර් 31 වෙනි දින දක්වා**
**සමිඳාණන් සමඟ ගමනෙහි යෙදෙමු4**

01. ආරම්භක ප්‍රශංසාව : පුබුදු ගී අංක 05 "ඥාන වීර්ය ශක්ති දැනුම...."

පිබිදුනු ක්‍රිස්තියානි කාරයන් ලෙස අප ලබා ඇති විශේෂිත ත්‍යාගයන් අතර ප්‍රශංසාවේ දීමනාව අප ලද මහඟු වූ තිළිණයකි. දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමට තරම් අප සුදුස්සන් වීමද භාග්‍යවන්ත කමකි. දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහැක්කේ ඔවුන් වහන්සේට ප්‍රේම කරන ඒ ප්‍රේමය අත්දකින අයට පමණි. පසුගිය සතිය පුරාම අප අත්දුටු දේව ප්‍රේමයේ බලය මුල් කරගෙන අද දවසේ ප්‍රශංසාවට ඇතුළු වෙමු.

පුබුදු ගී අංක 129 "පූර්ණයාණෙනි ඔබ දකින තුරා....."

02. පසුගිය සතියේ අත්දැකීම ළඟ සිටින කෙනෙකු සමඟ බෙදා ගන්න.

03. දවසේ සුපුවත : 1තෙසලෝනික 5:16-18

**"නිතරම ප්‍රීති වන්න. නොකඩවා යාච්ඤා කරන්න. සියල්ලෙහිදී ස්තූති දෙන්න. කිතුනුවන් වශයෙන් දෙවියන් වහන්සේ ඔබගෙන් බලාපොරොත්තු වන්නේ මෙය වේ"**

* කිතුනුවන් වශයෙන් දෙවියන් වහන්සේ අපෙන් බලාපොරොත්තු වන්නේ ඔවුන් වහන්සේ හා සම්බන්ධ වෙමින් ජීවත් වන ජීවිත පැවැත්මකි. ක්‍රිස්තුන් වහන්සේ පියාණන් වහන්සේ හා ඇති කරගත් සම්බන්ධකමට ඇතුළු වීමය. එසේ කරන්නට නම් අප යාච්ඤාවේ ජීවිතයක් ගත කළයුතු බව පසුගිය මාසය පුරාම අප ලද මගපෙන්වීම් තුළින් අවබෝධ කර ගත්තෙමු. යාච්ඤාව දෙවියන් වහන්සේ හා මා අතර ඇතිවන ගැඹුරු ප්‍රේමයේ සම්බන්ධකමයි.

* පසුගිය සති 4ක කාලය තුළ ඔබ ලද මගපෙන්වීම් ඔස්සේ යාච්ඤා කරන්නට ඔබට හැකි වූවාද? බෙදා ගන්න.

*   දිව්‍යමය කියවීම (ශු.ජොහාන් 14:16-18)
    ද්විත්ව අවදිවීම
    එළිපත්ත i
    එළිපත්ත ii
    ආලින්දය
    සාලය
    නිවහන / තුරුල්ල

    මේ පිළිබඳ ඔබේ අත්දැකීම කුමක් වීද?

*   මින් එක් පියවරකට හෝ පියවර කීපයකට  ඇතුළු වීමට ඔබට හැකි වීද?

*   විනාඩි 45ක කාලයක් ගෙන මගේ පැයට ඇතුළු කරන්න.

04. අවසාන ප්‍රශංසාව - පුබුදු ගී අංක 48 "තට්ටු කරමි...."

*****************